කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014

මගේ අංක : DMS/Circular/2014
කළමනාකරණ සේවා
දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
2014.03.31

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/
පළාත් ප්‍රධාන ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවය සහ පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය සඳහා තනතුරු අනුමත කිරීම සහ තනතුරු පුරප්පාඩු පිරවීම**

රාජ්‍ය සේවය සහ පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය සඳහා තනතුරු ඇති කිරීම සහ තනතුරු පුරප්පාඩු පිරවීම 2014.04.15 දින සිට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සිදුකළ යුතුය.

02. **තනතුරු ඇති කිරීම**

රාජ්‍ය සේවය, පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය වෙනුවෙන් තනතුරු අළුතින් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. ඒ සඳහා වන ඉල්ලීම්, ආයතන ප්‍රධානීන් විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම 01 ආකෘතිය, ප්‍රමාණවත් සාධාරණීකරණයක්ද සමඟින් අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතුය. නව තනතුරු ඇති කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අදාල වර්ෂය වෙනුවෙන් වෙන්ව නොමැතිනම්, එම තනතුරු අනුමත කරනු ලබන්නේ ඊළඟ අයවැය වර්ෂය සඳහාය.

03. **තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබාදීම**

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් PL, RS, MN, MT, GE හා SL වැටුප් ක්‍රමයන්ට අදාල රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන ආයතන ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ උසස්වීම්/විශ්‍රාම යාම/ඉල්ලා අස්වීම/මියයාම හේතුවෙන්

ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම් ගේ පූර්ව අනුමැතිය ඇතිව සිදුකළ හැකිය. එසේ අනුමැතිය ලබාදීමට පෙර, අදාල පුරප්පාඩු වී ඇති තනතුර/තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් විධිමත්ව අනුමත කරවාගෙන ඇති බව හා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම සඳහා අදාල දෙපාර්තමේන්තුව/ආයතන වෙත ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇති බව තහවුරු කරගැනීමට අමාත්‍යාංශ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම් විසින් කටයුතු කළ යුතුය.

ii. ඉහත 03 (i) ඡේදයෙහි සඳහන් හේතුවලින් පරිබාහිරව ඇතිවූ / ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා තවදුරටත් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. ඒ සඳහා වන ඉල්ලීම්, ආයතන ප්‍රධානීන් විසින් ප්‍රමාණවත් සාධාරණීකරණයන් සමඟ අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම් ගේ පෞද්ගලික නිර්දේශයද සහිතව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතුය.

iii. තනතුරු පුරප්පාඩු පිරවීම, එම තනතුරුවලට අදාල සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටින්හි විධිවිධානවලට අනුකූලවම සිදුකළ යුතුය.

04. මෙම චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව සිදුකරන බඳවාගැනීම්/පත්කිරීම්/උසස්කිරීම් සම්බන්ධයෙන් අදාල පත්වීම් බලධාරියා/ආයතන ප්‍රධානියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බව අවධාරණය කරන අතර, එවැනි අවස්ථාවන්හිදී අදාල නිලධාරීන් සම්බන්ධව නිසි විනය ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට අදාල විනය බලධාරියා විසින් අප්‍රමාදව කටයුතු කල යුතුය.

05. එමෙන්ම රාජ්‍ය සේවය සහ පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය සඳහා තනතුරු අනුමත කිරීම සහ තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් නිකුත් කළ 2006.04.10 දිනැති අංක 28, 2006.05.26 දිනැති අංක 28(I), 2006.08.01 දිනැති අංක 28 (II) කළමනාකරණ සේවා චක්‍රලේඛ උපදෙස් වෙනුවට මෙම චක්‍රලේඛ උපදෙස් බලාත්මක වේ. මෙම චක්‍රලේඛවල ඇතුලත් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වලට අදාල කරුණු තවදුරටත් නොවෙනස්ව පවතිනු ඇත.

06. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ 2007.08.01 දිනැති අංක 36 හා 2007.10.15 දිනැති අංක 36(I) කළමනාකරණ සේවා චක්‍රලේඛ අවලංගු වේ.

පී.බී.ජයසුන්දර

භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. විගණකාධිපති
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
8. ලේකම්, මුදල් කොමිෂන් සභාව

# <u>තනතුරු ඇති කිරීම සඳහා අයදුම්පත්‍රය</u>

- **I කොටස – සාමාන්‍ය තොරතුරු**

1. අමාත්‍යාංශය/පළාත් සභාව :…………………………………………………………………….…………
2. දෙපාර්තමේන්තුව හෝ ආයතනය :……………………………………………………………………
3. වැය ශීර්ෂය [ ] වැඩසටහන [ ] ව්‍යාපෘතිය [ ]

4. I. තනතුරු නාමය :……………………………………………………………………
   II. යෝජිත වැටුප් පරිමාණය :……………………………………………………………………
   III. සේවය/ ශ්‍රේණිය :……………………………………………………………………
   IV. අවශ්‍ය තනතුරු සංඛ්‍යාව : ………………………………………………………………..
   V. වාර්තා කල යුත්තේ කාටද : ………………………………………………………………..

5. තනතුරු අවශ්‍ය වන්නේ, *

   I. ස්ථිර පදනමින් [ ]

   II. අනියම් හෝ තාවකාලික පදනමින් [ ] සිට D D M M Y Y Y Y
   දක්වා D D M M Y Y Y Y

6. ආයතනයෙහි මෙම කාණ්ඩයෙහි හෝ මෙයට සමාන කාණ්ඩයක දැනට අනුමත සේවක සංඛ්‍යාව:

   I. අනුමත සේවක සංඛ්‍යාව [ | | | ]
   II. දැනට සිටින සේවක සංඛ්‍යාව [ | | | ]
   III. පුරප්පාඩු/අතිරික්ත සේවක සංඛ්‍යාව [ | | | ]

7. තනතුර අවශ්‍ය වන්නේ,*

   නව ක්‍රියාකාරකම/ක්‍රියාකාරකම් [ ]
   පවත්නා කාර්යය/කාර්යයන් පුළුල් කිරීම [ ]
   අතපසු වූ වැඩ නිම කිරීම [ ]
   උසස්වීම් ලබා දීමේ අපේක්ෂාව [ ]
   වෙනත් [ ]

*වෙනත් හේතුවක් නම්, තනතුර ඇති කිරීමට හේතු.*

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

8. අවශ්‍ය තනතුරු සඳහා සාධාරණීකරණයන් වෙනම පත්‍රිකාවක දක්වන්න.

**සටහන : * අදාල කොටුව තුල හරි ( ✓ )ලකුණ යොදන්න.**

9. මීට පෙර මෙම තනතුරු සඳහා මෙවැනි ඉල්ලීමක් කර තිබේ ද?*

ඔව් ☐ නැත ☐

I. පිළිතුර "ඔව්" නම් , ලැබුණු තීරණය කුමක්ද? …………………………………………......

II. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ යොමු අංකය සහ දිනය දක්වන්න: ………………...

10. I තනතුර/තනතුරු ඇති කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත වාර්ෂික වියදම: රු…………………..

II. ඇස්තමේන්තු ගත වාර්ෂික වියදම, ආවරණය කරන්නේ *

| | |
|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුවෙහි ඇතුලත් කිරීම | ☐ |
| වීරමොං පටිපාටිය | ☐ |
| පරිපූරක ඇස්තමේන්තු ඉල්ලා සිටීම | ☐ |
| අනෙක් තනතුරු යටපත් කිරීම නිසා ඇති කර ගත් ඉතිරි කිරීම් | ☐ |

*එසේ නම්, තනතුරු නාමය :* …………………………..

*තනතුරු ගණන :*…………………………

වෙනත් ☐

*වෙනත් ආකාරයකින් නම්,ඒ කෙසේද යන්න සඳහන් කරන්න*

…………………………………………………………………………………..

…………………………………………………………………………………..

…………………………………………………………………………………..

- **II කොටස – නිරීක්ෂණ සහ නිර්දේශ**

11. මෙම ඉල්ලීම සම්බන්ධයෙන්, දැනට සිටින කාර්ය මණ්ඩලය, පුරප්පාඩු සංඛ්‍යාව, වැඩසටහනට/ව්‍යාපෘතියට ලබන සාපේක්ෂ ප්‍රමුඛතාවය සහ අයදුම්කරනු ලබන තනතුරට අයත් කාර්යයන් යන කරුණු සලකා බලන ලදී. දැනට සිටින කාර්ය මණ්ඩලය නැවත සංවර්ධනය කිරීමේ හැකියාව, ලැබිය හැකි ප්‍රතිලාභ සහ විකල්ප පිරිවැය සලකා බැලීමේදී ඉල්ලීම යුක්ති සහගත ලෙස සැලකිය හැකි/ අඩු කල හැකි/ප්‍රමාද කල හැකි බව සහතික වේ.

…………………………………………… …………………………

ආයතන ප්‍රධානියාගේ අත්සන දිනය

12. අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………

……………………………………….... ………………………
අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම් දිනය

**සටහන : * අදාල කොටුව තුල හරි ( ✓ )ලකුණ යොදන්න.**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

- **III කොටස - කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය**

13. ඉදිරිපත් කළ අයදුම්පත්‍රයට අනුව, පහත සඳහන් තනතුරු සංඛ්‍යාව ඇති කිරීම අනුමත කරමි/ නොකරමි.

| | |
|---|---|
| ආයතනයේ නම | :…………………………………………………………… |
| තනතුරු නාමය | : …………………………………………………………… |
| සේවය සහ ශ්‍රේණිය | : ………………………………………………………… |
| තනතුරු සංඛ්‍යාව | : |
| වැටුප් පරිමාණය | : …………………………………………………………… |

……………………………………………… ……………………….

අත්සන<br>අධ්‍යක්ෂ ජනරාල්<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

දිනය

**සටහන : * අදාල කොටුව තුල හරි ( ✓ )ලකුණ යොදන්න.**